ශ්‍රී. බු. ව. 2558 ක්වූ බිනර මස කලාපය, රාජ්‍ය වර්ෂ 2014 ක් වූ සැප්තැම්බර් මස 08 වන දින

වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතා ගරු යාවජීව සභාපති

ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

**අභූත චෝදනාවට අභීත සිහනද පෑ අයුරු**

ධම්කාමී පින්වතුනි,

අද බිනර පුර පසළොස්වක පොහොය දිනයයි. භාග්‍යවත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ සුළු මවු වන මහා ප්‍රජාපතී ගෝතමී රැජිණිය මහණ උපසම්පදාව ලැබූයේ අද වැනි පුර පොහෝ දවසකයි. අද මෙම සදහම් පණිවුඩයට මාතෘකාව ලෙසට භාවිතා කළේ සූත්‍ර පිටකයේ අඟොත් සඟියේ 05 වෙනි පොතේ නවක නිපාතයට අයත් සීහනාද වර්ගයේ පළමු සූත්‍රයයි. සීහනාදය යනු සිංහයාගේ හඬයි. සිංහයා විසින් සිංහනාදය කරන්නේ භය සහ සැක දුරුකරලයි. මේ සූත්‍රයේදී "සීහනාද" යන වචනය භාවිතා කර ඇත්තේ ආත්ම විශ්වාසයෙන් කරන ලද ප්‍රකාශයක් නිසාය. එහි ඇතුළත් වන්නේ සත්‍යයයි. අංශු මාත්‍රයක් හෝ අසත්‍ය මිශ්‍ර වී ඇත්නම් එය භය සහිත ප්‍රකාශයකි. සීහනාදයක් වන්නේ හිතට එකඟව පිරිස ඉදිරියේ සත්‍යයම ප්‍රකාශ කිරීමකි. එවැනි ප්‍රකාශයක් පළමුවෙන් තුන් ලෝකයටම කරන ලද්දේ තථාගතයන් වහන්සේ පමණි. ඒ තරම් නොවුවද සීහනාදයක් පිළිබඳව මේ සූත්‍රයෙන් දැනගත හැකිය.

මේ සීහනාදය කර ඇත්තේ, ගෞතම සම්මා සම්බුදු සසුනේ ප්‍රඥාවෙන් අගතැන් ලැබුනු ධම්සේනාධිපති සාරිපුත්ත මහ රහතන් වහන්සේ විසිනි. භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන විහාරයේ වාසය කරන කල මේ දේශනාවට හේතු සකස් වුනා. එක්තරා වස් කාලයක් අවසානයේදී භික්ෂූන් වහන්සේ පිරිසක් සමග සැරියුත් හාමුදුරුවො චාරිකාවේ වැඩම කිරීමට භාග්‍යවතුන් වහන්සේගෙන් අවසර ගත්තා. ඒ දැක ඊර්ෂ්‍යාවෙන් බරිත වූ එක්තරා භික්ෂූන් වහන්සේ නමක් භාග්‍යවතුන් වහන්සේට කියනවා. "ස්වාමීනි ! ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් මේ දැන් මගේ ඇගේ හැපීගෙන සමාව ගන්නෙවත් නැතුව පිටත් වුනා." බුදුහාමුදුරුවො මෙහි සත්‍ය අසත්‍ය හොඳින් දකිනවා. කිසිවක් නොවදරා තවත් හාමුදුරු නමක් ලවා සැරියුත් හාමුදුරුවො ගෙන්වූවා. සැරියුත් හාමුදුරුවො බුදුහිමියන් වෙත වැඩම කළා.

ඒ අවස්ථාවේදී මහ මුගලන් හිමි සහ ආනන්ද හිමියන් දොර යතුරු ගෙන වෙහෙරින් වෙහෙරට ගොස් භික්ෂූන් වහන්සේලාට කිව්වා. "ප්‍රිය ආයුෂ්මතුනි දැන් සැරියුත් හාමුදුරුවො භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී සිංහනාද කරනවා" යනුවෙනි. ඒ අතර භාග්‍යවතුන් වහන්සේ "සාරිපුත්තයෙනි ! මේ සිටින භික්ෂුවගෙ ඇගේ හැපිල සමාවවත් නොගෙන චාරිකාවේ ගියා කියන්නෙ සත්‍යයද? එවිට තම නිදොස් භාවය භාග්‍යවතුන් වහන්සේ සාක්ෂි කොට නිහතමානීව ආර්‍ය විනයට අනුව කරුණු නවයකින් ප්‍රකාශ කරනවා.

01. ස්වාමීනි ! ශාස්තෘ වූ භාග්‍යවතුන් වහන්ස, කවුරු හරි කායගතා සතිය නොවඩනවානම් (කය අනුව සිත නොපවත්වනවානම්) එකට වාසය කරන කෙනෙකුගෙ ඇගේ හැපිල වරදට සමාවද

නොගෙන යාවි. එය නිවැරදියි. නමුත් බුදුහාමුදුරුවනේ ! මම එහෙම කෙනෙකු නෙවි. කරුණු නමයෙදීම මේ විදියට මේ වාක්‍ය සැරියුත් හාමුදුරුවෝ ප්‍රකාශ කරනව.

මෙහිදී කායගතා සතිය කුමක්ද කියා සුළුවෙන් හෝ සිහිපත් කර ගනිමු. කාය යනු සමූහය කියන අර්ථයයි. සෑම සත්ව යෙකුටම පංචස්කන්ධය කියල පොදු නමක් ශාසනික වශයෙන් භාවිතා කරනව. ස්ඛන්ධ කියන වචනයේ තේරුමත් රාශියක් කියන අර්ථයයි. රූප කලාප සමූහයක එකතුව රූප කායයි. වේදනා සමූහයක එකතුව වේදනා කායයි. සඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්ඛන්ධ සමූහයේ එකතු තුනට පිළිවෙලින් සඤා කාය, සංඛාර කාය, විඤ්ඤාණ කායකියල කියනව. ඒ පිළිබඳව අවබෝධයෙන් සිත පැවැත්වීම "කායගතා සතිය" හෙවත් කය අනුව පවත්වන සිත හෙවත් සිහියයි. ඒ සඳහා පුහුණු ක්‍රම කීපයක් තිබේ. හුස්ම ඉහළ පහළ ගැනීම පිළිබඳ සිහිය පැවැත්වීම "ආනාපානා සති" භාවනාවයි. සතර ඉරියව් පිළිබඳව සිහියෙන් සිටීම "ඉරියාපථ" භාවනාවයි. නුවණින් සළකා ඉරියව් හැසිරවීම "චතු සම්පජඤ්ඤ" භාවනාවයි. ශරීරයේ තිබෙන කුණප කොටස් 32 පිළිබඳව මෙනෙහි කිරීම "අසුභානුසසති" භාවනාවයි. සතර මහා ධාතූන් ශරීරයේ ක්‍රියාත්මක වන විධි මෙනෙහි කිරීම "ධාතු මනසිකාර" භාවනාවයි. මළ සිරුරක් විකෘති වන වෙනස් වන ආකාරය පිළිබඳව මෙනෙහි කිරීම "නවසීවථික" භාවනාවයි. මේ සියල්ල කායගතා සතිය හෙවත් කායානුපස්සනාවයි. කය අනුව නුවණින් දැකීම සහ දැන ගැනීමයි. මේ භාවනා නිතර පවත් වන විට නීවරණ සිඳේ. සිත එකඟ වේ. සමාධිය ඇතිවේ. ස්පර්ශය නිසා ප්‍රත්‍යයන්ගෙන් හටගන්න සැප, දුක්, උපේක්ෂා, වේදනා පිළිබඳව සිහියෙන් සිටීමෙන් සිහිය දියුණු වී කය පිළිබඳ ගැටලු, වැරදි වැඩ නතර වේ. සැරියුත් හාමුදුරුවෝ මෙහිදී අවධාරණය කරන්නේ "එවැනි කෙනෙකු නෙවි මම" යනුවෙන් එසේ සිත දියුණු කළ කෙනෙකුගෙන් ඔය වරද සිදු නොවේ යනුවෙනි. දැන් තරමක් කායගතා සතිය වැටහෙනු ඇතැයි සිතමු.

ඊළඟට සැරියුත් හාමුදුරුවෝ කියනව. පළමු කාරණය යටතේම මේ මහ පොළොවට පිරිසිදු සහ අපිරිසිදු දේත්, මල මුත්‍ර, කෙළ, ලේ, මළකුණු ආදියත් දානව. එනමුත් මහපොළොව එයින් පීඩාවට ලැජ්ජාවට පිළිකුලට පත්වෙන්නෙ නැහැ. ස්වාමීනි ! මමත් මහපොළොව සමානව හිත පවත්වනව. එහෙම ප්‍රකාශ කරල කරුණු නමයෙදීම මෙසේද තමන් වහන්සේගේ සිත පවත්වන විදි කියනව. "ස්වාමීනි, විපුල වූ මහද්ගතවූ අප්‍රමාණ වූ අවෛරවූ නිදුක්ව වාසය කරමි. එනම් අප්‍රමාණව මෛත්‍රියෙන් වාසය කරන බවයි. ඇලීම, ගැටීම නැති තැන මෛත්‍රිය ඇත. කෙනෙකු මෛත්‍රී කරන විට තරහව නැතිවී ගැටුම් නැතිවිය හැකිය. සියුම්ව ඇලීම ඇතිවේ. ඇලීමද නැති තැන නියම මෛත්‍රිය බවට සැරියුත් මාහිමියන් තම ජීවිතයෙන් ලෝකයට පරමාදර්ශයක් දෙනව.

2. ඊළඟට සැරියුත් හාමුදුරුවෝ ප්‍රකාශ කරනව. භාග්‍යවතුන් වහන්ස, මේ චෝදනාව කායගතා සතිය නොවැඩූ කෙනෙකුට හොඳයි. මම ජලය වගෙයි. ජලය පිරිසිදු සහ අපිරිසිදු දේත් සෝදනව. මළ මුත්‍ර ආදියත් කෙළ, ලේ, මළකුණු ආදියත් සෝදනව. එනමුත් ජලය එයින් පීඩාවට ලැජ්ජාවට පිළිකුළට පත් නොවේ. මම ද ජලය (ආපෝ ධාතුව) සමානව නිදුක්ව අවෛරීව වාසය කරමි.

3. ස්වාමීනි ! යමෙක් කායගතා සතියෙහි නොයෙදී සිහිය පවත්වයිද ඔහු කෙනෙකුගෙ ඇඟේ හැපී සමාවද නොගෙන යාවි. මම එහෙම කෙනෙකු නෙවි. ස්වාමීනි බුදුරජාණන් වහන්ස, යම් ලෙසකින් ගින්න විසින් පිරිසිදු අපිරිසිදු මළ මුත්‍ර ආදී දේ දවා හළු කරයිද, එනමුත් එයින් ගින්න

පීඩාවට ලැජ්ජාවට පිළිකුලට පත් නොවේ. එම ගින්න (තේජෝ ධාතුව) සමාන සිතින් නිදුක්ව වාසය කරමි.

4. ස්වාමීනි ! බුදුරජාණන් වහන්ස මම කාය ගතා සතිය නොවැඩූ කෙනෙකු ලෙස වරද කරමින් සමාවද නොගෙන මගහැර නොයමි. මම සංඝරත්නය මැද වාසය කරන්නේ හමන සුළඟ සමානවයි. සුළඟ හොඳ, නරක, ගඳ, දුගඳ, මළ මුත්‍ර, කුණු ආදී හැම දෙයක්ම හමායනව. සුළඟ එයින් පීඩා, ලැජ්ජා, පිළිකුල් නොවේ. ඒ පරිදි වායු සම සිතින් මමද නිදුක්ව අප්‍රමාණ මෛත්‍රියෙන් වාසය කරමි.

5. භාග්‍යවතුන් වහන්ස කය අනුව සිත පවත්වන්නෙ නැති කෙනෙකුට තවත් කෙනෙකුගෙ ඇඟේ හැපී සමාවද නොගෙන ගියා කීම ගැලපෙනව, ස්වාමීනි මම කුණු පිසදාන රෙදි කඩක් වගෙයි. ඒ රෙදි කඩින් පිරිසිදු සහ අපිරිසිදු දේත් කෙළ, ලේ, මළ මුත්‍ර ආදී නොයෙක් දේ පිසදමනව. එයින් පිස්නා රෙදිකඩ පීඩාවට පත්නොවේ. පිළිකුලටද, ලැජ්ජාවටද පත් නොවේ. මමද පිස්නා රෙදිකඩක් බඳු සිතින් ඇලීමෙන් ගැටීමෙන් තොරවූ සිතින් දුක් නොවී මෙත් සිතින් වාසය කරමි.

6. ස්වාමීනි ! කවුරු හෝ කය අනුව සිහිය පවත්වන්නෙ නැතිනම් ඔහුට මේ චෝදනාව ගැළපෙනව. නමුත් බුදුහාමුදුරුවනේ මම එවැනි කෙනෙකු නෙවි. මම වාසය කරන්නෙ පහත් යයි සම්මත කුළයක උපන් කොළ පතක් අතින් ගත් කුඩා රෙදිකඩකින් විළි වසාගත් කුඩා සැඩොල් ළමයෙකු වගෙයි. මානය නැතිව යටහත් පහත් මානසිකත්වයකින් නිහතමානීව ඉහත කී සැඩොල් දරුවෙකු සේ සම සිතින් මේ සඟ මැද ඇලීම් ගැටීමෙන් තොරව මැදහත්ව වාසය කරනව.

7. භාග්‍යවතුන් වහන්ස ! තවත් ආකාරයකින් කියන්නේ නම් යමෙකු ඒකාන්තයෙන් කායගතා සතිය නැතිව ඔහු එකට වාසය කරන කෙනෙකුගේ ඇඟේ හැපී සමාවද නොගෙන ගියාය කියන කථාව සත්‍යයකි. එය විය හැකිය. එනමුත් බුදු පියාණෙනි, මම මගේ සිත පවත්වන්නෙ අං දෙකම සිඳුනු ඉතා මෙල්ලවුනු ගවයෙකු ලෙසටයි. ඒ ගවයා හතර මං හන්දියෙන් හතර මං හන්දියට ඇවිද යාද, පයෙන් හෝ අඟින් කිසිවෙකුට හිංසා නොකරයිද, ඒ වාගේ මේ සඟ මැද කවදා කොතැනකදීවත් කිසිවෙකුට හිංසා පීඩා නොකොට මෛත්‍රියෙන් නිදුක්ව ඇලීම් ගැටීම් වලින් තොරව මැදහත්ව වාසය කරමි.

8. බුදු පියාණනි ! කායගතා සතියට නොපැමිණි යමෙකුට මේ චෝදනාව ගැළපෙනව. නමුත් ඒ චෝදනාවට මා නොසුදුසු වන්නේ මම මේ විදියෙ කෙනෙකි. යම් ආකාරයකින් තරුණ වයසේ පසුවන ඉතා පිරිසිදුව ප්‍රසන්නව ඉන්න කැමති ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් වේ නම් නා පිරිසිදු වී සුවඳ ගල්වා සිටින විටකදී කවුරු හෝ ඔහුට ඇයට සර්පයකුගේ හෝ මිනිසකුගේ හෝ සුනඛයෙකුගේ හෝ ඉතා කුණු වී දුගඳ හමන මළ කුණක් කරේ ඔතාවිද, ඒ තැනැත්තා එයින් පීඩාවට, පිළිකුලට, ලැජ්ජාවට පත්වේද ඒ සමාන සිතින් මම මේ කුණු කය පරිහරණය කරමි. ලජ්ජිත වෙමි. පිළිකුල් කරමි. පීඩා වෙමි. ඒ බව දැන ඇලීම් ගැටීම් වලින් තොරව මෛත්‍රියෙන් නිදුක්ව වාසය කරමි.

9. ස්වාමීනි අවසාන වශයෙන් මාගේ නිදොස් බව මෙසේ ප්‍රකාශ කරමි. මේ චෝදනාව කායගතා සතිය නොවැඩූ කෙනෙකුට හොබනේය. මන්දයත්? මම එසේ නොවෙමි. යම්කිසි පුරුෂයෙක් ලොකු කුඩා සිදුරු ඇති උඩින් යටින් වෑස්සෙන සාරය ඇති මේද තෙල් පිරුණු සැළියක් පරිහරණය කෙරේද, ස්වාමීනි ! මමද එ පරිදි ලොකු කුඩා සිදුරු ඇති උඩුමුවින් යටිමුවින්

වෑහෙන අසූචි ඇති මේ කය පරිහරණය කරමි. එසේ නොකරන කායගතා සතිය නැති කෙනෙකු තවත් කෙනෙකුගේ ඇඟේ හැපී සමාව නොගෙන ගියා කිව්වොත් එය නිවැරදිය.

ඒ ආකාරයෙන් තමන් වහන්සේ ළඟ තිබෙන මේ අසහාය ගුණ සමුදාය භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටින එම සභාවේ ප්‍රකාශ කරද්දී ඉහත කී බොරු චෝදනාව කරපු ඒ ස්වාමීන් වහන්සේ එතැනින් නැගිට බුදු සිරිපතුල් අභියස තම හිස තබා බුදු හාමුදුරුවනේ ! මම ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට අභූත චෝදනාවක් කළෙමි. මගේ වරද මම ඉක්මවා ගියා. නැවත මෙවැනි වැරදි නොකරමි. ස්වාමීනි ! මතු මතුත් සංවර වීමට ඒ අපරාධය අපරාධයක් ලෙසට පිළිගෙන මට සමාව වදාරන්න යැයි ඉල්ලීමක් කළේය.

එවිට භාග්‍යවතුන් වහන්සේ සැරියුත් හිමියන් අමතා "ශාරිපුත්‍රය, මොහුගේ හිස මෙතැනදීම හත් කඩක් වී පැලෙන්නට පෙර මේ හිස් වූ පුද්ගලයාට සමාව දෙන්න.

ස්වාමීනි ! ඒ ආයුෂ්මතුන් මට සමාව දෙන්නේ නම් මමද ඔහුට සමාව දෙමියි සැරියුත් මාහිමියන්ගේ නිහතමානී ගතිය තවදුරටත් තහවුරු කළහ.

බුදුහිමියන් ඒ භික්ෂූන් වහන්සේ අමතා, "තොප මේ වරද, වරද ලෙසට පිළිගැනීම කරන්නේ නම් දහමට අනුව කටයුතු කරවු. එසේ, ආර්‍ය්‍ය විනයට අනුව කටයුතු කරයි නම් එය තොපට මතු අභිවෘද්ධියෙක් මය" යි වදාළහ.

සැරියුත් හාමුදුරුවන් වහන්සේ කරන ලද මේ ප්‍රකාශය සිංහ නාදයක් විය. වත්මන් සමාජයේ අභූත ප්‍රකාශ කරන ලොකු, කුඩා, උස්, පහත් හැම පුද්ගලයෙකුටම හැම ආයතනයකටම මෙය ආදර්ශමත් සිංහ නාදයකි. සැරියුත් හාමුදුරුවන් එම සිංහ නාදය ආකාර නමයකින් සිදුකරනව. ඒ සඳහා ගත් උපමා විශ්ව සාධාරණ උපමාවන් නවයකි. උන්වහන්සේ නිරන්තර සිහියෙන් සතර සතිපට්ඨානයෙන් යුතුව වැඩ සිටීම එයින් හැඟේ.

"සුපප බුඬං පබුජ්කධනති - සදා ගෞතම සාවකා

යෙසං දිවාච රතෙතාච - නිච්චං කාය ගතා සති"

(ධමම පදය)

කය අරමුණු කොට උපදිනා සිහි ඇති බුධ ශ්‍රාවකයෝ (භික්‍ෂු, භික්‍ෂුණී, උපාසක, උපාසිකා) සුවසේ නිදියති. සුවසේ අවදිවෙති.

මෙවැනි උත්තම ගුණ ඇති ශ්‍රාවකයන් ලැබීමට හේතුව බුදුවරයන් වහන්සේලාගේ පාරමිතා බලයයි. පිං ඇති දු පුතුන් ශිෂ්‍යයින් ආදීන් ලැබීමට ඊට අදාල කුසල් දහම් බලය බව මෙයින් තේරුම් ගත යුතුය.

සත්ව ශරීරය දිහා අපි දකින්නේ බාහිර පැත්ත පමණි. අපි අතර බොහෝ දෙනෙක් නොදකින නොපෙනෙන තවත් පැත්තක් ඇති බව අමතක නොකළ යුතුය. කායගතා සතියෙන් පමණක් නොව එය සතර සතිපට්ඨානයම වැඩීමෙන් දැකගත හැක.

අපේ ජීවිතයේ කොයිතරම් අවස්ථාවන්හිදී අපි මානය ඇතිකරගෙන වැරදි කර ඇත්දැයි විමසීම අපිට පැවරේ. සැරියුත් හාමුදුරුවෝ මේ පාටිච්චිය මත බුදුහිමියන් හැරුනු විට ප්‍රඥාවෙන් අග්‍රස්ථානයට පත්වුනා. ශ්‍රාවකයින් අතර අග්‍රස්ථානයට පත්වුනා. උන්වහන්සේ මානය දුරුකළා. ඤාණය මතුකළා. ඒ තනතුරු තානාන්තර වලින් උන්වහන්සේ කිසිතැනක උදම් වී නැත. කිසිවෙකු පහත් කොට නැත. දිවා රාත්‍රී දෙකෙහි සතර සතිපට්ඨානයම වැඩූහ. මෙතැනදී කායගතා සතිය භුවා දැක්වූයේ කය, කයේ හැපීමෙන් ඇතිවූවා යයි නැගූ අභූත චෝදනාව හෙයිනි.

වත්මන් ලෝකයේ ''අපි සිංහ වංශයේ ය'' යි කියා ඇතැමුන් හම පොරවාගත් සිංහනාද කරනුයේ සුනඛයින්වත් නොකරන ක්‍රියාවන්ට බව මෙයින් දැන උගත යුතුය. අපිද මෙවැනි අභූත චෝදනා, නින්දා, අපහාස, හිංසා වලට ලක්විය හැකිය. ඒවා අප කරා පැමිණෙන විට කලබල නොවී සැරියුත් හාමුදුරුවෝ මෙනෙහි කරපු මේ කරුණු නවය හිතට ගත්තොත් මේ ශරීරයෙන් මානයට පත්නොවී තියන මානය අඩුකරගත හැකිවේ. සැරියුත් හාමුදුරුවන්ට තරම් අපිට බැරිවුනත් සැනසීමෙන් ඇලීමෙන් ගැටීමෙන් තොරව නින්ද යෑම අවදිවීම වත් සකස් කරගෙන ඒ අනුව වටිනාකමක් ඇති ජීවිතයක් ගොඩනගා ගැනීමට සැරියුත් හාමුදුරුවෝ අප සැමට පූර්වාදර්ශයක් වේවායි මේ බිනර පෝදා අදිටන් කරගනිමු.